# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2094/37 - 2018 ඔක්තෝබර් මස 26 වැනි සිකුරාදා - 2018.10.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ෆයිසර් මුස්තපා,
ජනාධිපති නීතිඥ,
පළාත් සභා, පළාත් පාලන හා
ක්‍රීඩා අමාත්‍ය.

2018 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍ය ෆයිසර් මුස්තපා (ජනාධිපති නීතිඥ) වන මම 2018.05.31 දිනැති අංක 2073/15 දරන ගැසට් නිවේදනය මගින් පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් හේවා තොන්ඩිලගේ කමල් පත්මසිරි මහතා 'ශ්‍රී ලංකා ක්‍රිකට්' ආයතනයේ පරිපාලන කටයුතු යථායෝග්‍ය අයුරින් ඉටුකිරීම් වස් එකී පරිපාලන හා වෙනත් යම් යම් අවැසි කටයුතු ඉටුකිරීම උදෙසා 2018 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එහි නිසි බලධාරියා වශයෙන් පත් කරන ලද හෙයින් ද,

ඒ අනුව 'ශ්‍රී ලංකා ක්‍රිකට්'හි පරිපාලනය යථායෝග්‍ය අයුරින් ඉටුකිරීම සඳහා එකී පරිපාලනමය හා වෙනත් යම් යම් අවශ්‍ය කටයුතු ඉටුකිරීමට අනුෂංගික වශයෙන් ඉහත කී නිසි බලධාරියාහට සහය දීමට සහ උපදෙස් දීම පිණිස 'ශ්‍රී ලංකා ක්‍රිකට්' ආයතනයට නිලධාරීන් තෝරා පත්කර ගැනීම සඳහා නිලවරණයක් පවත්වන තෙක් කමිටුවක් පත්කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ජාත්‍යන්තර ක්‍රිකට් පාලක මණ්ඩලය වන ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයට පොරොන්දු වී ඇත.

1A - PG 4297 — 507 (2018/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඒ අනුව පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍ය ෆයිසර් මුස්තෆා (ජනාධිපති නීතිඥ) වන මම 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ (සංශෝධිත) 41 වැනි වගන්තිය ප්‍රකාරව,

(අ) 'ශ්‍රී ලංකා ක්‍රිකට්'හි පරිපාලන කටයුතු යථායෝග්‍ය අයුරින් ඉටුකිරීම සඳහා එකී පරිපාලන හා වෙනත් යම් යම් අවැසි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා 2018 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් 'ශ්‍රී ලංකා ක්‍රිකට්'හි නිසි බලධාරියා වශයෙන් පත් කරමි.

(ආ) 'ශ්‍රී ලංකා ක්‍රිකට්' ආයතනයේ පරිපාලන කටයුතු යථායෝග්‍ය අයුරින් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා එකී පරිපාලන හා වෙනත් යම් යම් අවැසි කටයුතු ඉටුකිරීමේදී එකී නිසි බලධාරියාට සහය දීම පිණිස කීර්තිමත් පුද්ගලයින් පස්දෙනෙකු මෙයින් පත්කරනු ලැබේ.

(ඇ) නිලවරණයක් පවත්වා 'ශ්‍රී ලංකා ක්‍රිකට්' ආයතනයට නිලධාරීන් තෝරා පත්කරගනු ලබන තෙක් ඉහත කී උපදේශක කමිටුව අඛණ්ඩව කටයුතු කරගෙන යා යුතුය.

(ඈ) එකී කමිටුවේ යම් සාමාජිකයෙකුගේ අභාවය, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් අකර්මන්‍යතාවයක දී වෙනත් යම් තැනැත්තෙකු ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් ඒ සඳහා නම් කරනු ලබන තෙක් එකී උපදේශක කමිටුව කටයුතු කළ යුතුය.

2018 මැයි මස 31 දිනැති අංක 2073/15 දරන *ගැසට් නිවේදනය* 2018.10.29 වැනි දින සිට මෙයින් පරිච්ඡින්න කරනු ලබයි.

11 - 414

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.